# නිවාප සූත්‍රය

(ම.නි. 1)

නිවාප හෙවත් තණබිමක් උපමා කොට වදාළ මෙම සූත්‍රය මජ්ඣිම නිකාය නම් ග්‍රන්ථයෙහි ඇතැළත් වේ. භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වෙසෙන සමයෙහි භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් මෙම සූත්‍රය දේශනා කොට තිබේ. වැද්දන් විසින් සරුලෙස තණබිමක් වගාකොට ඊට මුවන් යොමු කොට ඔවුන් කොටුකර තම ග්‍රහණයට හසුකර ගැනීම මෙමගින් විස්තර වේ. මුවන් ඇල්ලීමට යොදන ඉහත උපක්‍රමයක් උපමා කර ගනිමින් කෙලෙසුන්ගෙන් නිදහස්වීමට කැමැති ශ්‍රාවකයා ක්‍රියා කරන ආකාරය සූත්‍රයෙන් විස්තර වේ.

තණකොළ වගාකොට උපක්‍රමශීලීව ඒ වෙත මුවන් යොමු කරවා ඔවුන් තම ග්‍රහණයට හසුකර ගැනීම වැද්දන් විසින් යොදන උපක්‍රමයකි. මෙලෙස වැද්දන් තණකොළ වවන කල්හි 'මෙම වවන කණකොළ අනුභව කරන මුවෝ දිගාසිරි විඳිත්වා, රූමත් වෙත්වා, දිගුකලක් යහතින් වෙසෙත්වා' යන අදහසින් ඔවුහු තණකොළ වගා **නොකරති.** මුව වැද්දන් තණකොළ වගා කරන්නේ මේ තණබිමට පැමිණෙන මුවන් තෘෂ්ණාවෙන් මුළාවට පත් ව තණකොළ අනුභව කොට මත් ව සිටින කල්හි තමන් කැමැති පරිදි අල්ලා ගැනීමේ අදහසිනි.

මෙලෙස තණකොළ වගාකර තිබූ කල්හි එක්තරා මුව රංචුවක් ඒ වෙත පැමිණ තණකොළ අනුභව කොට මුළාවට පත් ව සිහිසන් නැති ව එහි ලැග සිටියහ. ඒ අතර මුව වැද්දා එහි පැමිණ මුළාවට පත් ව සිටි මුව සමූහයා අල්ලා ගෙන තම වසඟයට ගත්තේ ය. එම පළමු මුව රංචුව මුව වැද්දාගේ ග්‍රහණයෙන් නොමිදුණාහ.

පළමු මුව රංචුවට අත් වූ ඉරණම දුටු දෙවන මුව රංචුව එම අනතුරින් මිදීමේ උපායක් සිතූහ. ඒ අනුව ඔවුහු මුව වැද්දා වගා කළ තණබිමට නොපැමිණ වනයෙහි ඈත සිටිමින් තණකොළ පැළැටි ආදි අනුභව කරමින් කල් ගත කළහ. එහෙත් වැසි කාලය අවසන් වී ග්‍රීෂ්ම කාලය පැමිණි කල්හි වනයෙහි තණකොළ පැළැටි ආදිය වියැළී ගිය විට ඔවුන්ට ආහාර හිඟ විය. මේ අතර දැඩි කුසගින්න නිසා ඔවුන් කලින් සිතා සිටි ස්ථාවරයෙහි තවදුරටත් සිටීමට නොහැකිව වැද්දා වගා කළ තණබිම කරා පැමිණීමට දෙවන මුව රංචුවට ද සිදු විය. තණබිම කරා පැමිණි එම මුව රංචුව එහි තිබූ තණකොළ අනුභව කොට කලින් මුව රංචුව මෙන් මුසපත් ව සිටි කල්හි මුව වැද්දා පැමිණ ඔවුන් අල්ලා ගත්තේ ය. මෙලෙස දෙවන මුව රංචුව ද වැද්දාගේ උපක්‍රමයට අසු වී අනතුරට පත් වූහ.

පළමු හා දෙවන මුව රංචුවට සිදු වූ ඉරණම මැනැවින් තේරුම් ගත් තෙවන මුව රංචුව තණබිමට ඇතුළු නොවී එහි අවට ආසන්නයේ සිට තණ අනුභව කොට මුසපත් නොවී සමීපයෙහි වනයට ගොස් විවේකීව සිටියහ. තුන්වන මුව රංචුවේ මෙම හැසිරීම දුටු මුව වැද්දා ඔවුන්ගේ ස්වභාවය තේරුම් ගෙන එම මුවන් ලැග සිටි අවට වනය වටකොට ඔවුන් ද තම ග්‍රහණයට හසු කර ගත්තේය. ඒ අනුව තෙවන මුව රංචුව ද වැද්දාගේ ග්‍රහණයෙන් නොමිදුණාහ.

පළමු, දෙවන හා තෙවන යන මුවරංචු තුනට ම අත්වූ මාරාන්තික ඉරණම දුටු සිව්වන මුව රංචුව එම තණබිමට ඇතුළු නොවී ආසන්නයේ සිට තණකොළ අනුභව කොට මුව වැද්දාට යා නොහැකි ඈත පෙදෙසකට ගියහ. ඒ අතර විටින් විට පැමිණ තමන් කැමැති පරිදි තණ අනුභව කොට සිහිමුළා නොවී ප්‍රමාදි නොවී ඉක්මනින් ඉන් ඉවත් ව ඈත පෙදෙසට දිව ගියහ. සිව්වන මුව රංචුවේ මෙම ක්‍රියාව දුටු මුව වැද්දා හා ඔහුගේ පිරිස එම මුව රංචුවට හානියක් නොකළහ. ඔවුන්ට බාධා කළහොත් වනයෙහි අනෙක් මුවන් ද කලබලයට පත් ව තමාට කිසිදු ගොදුරක් නොලැබෙන බව දුටු මුව වැද්දා එම සිව්වන මුව රංචුවට කැමැති පරිදි තණකොළ කෑමට ඉඩ දී මැදහත් වූහ.

මෙලෙස තණබිමට පැමිණි මුවන්ගේ චර්යාව උපමා කොට ගනිමින් භාග්‍යවතුන් වහන්සේ ධර්මයෙහි හැසිරෙන ශ්‍රාවකයන්ගේ ස්වභාවය විස්තර කර ඇත. ඒ අනුව ධර්මයෙහි හැසිරෙන ඇතැමෙක් (ඇස, කන, නාසය, දිව, කය යන) පංචකාමට ගොදුරු වී දහම් මගින් ඉවත් වෙති. ඔවුහු ආරම්භයේ දී ම ධර්මය අතහැර කාමභෝගී ජීවිතයෙහි ගිලී වාසය කරති. පළමු මුව රංචුව මුව වැද්දාට හසු වූවක් මෙන් මෙම පළමු ශ්‍රාවක පිරිස ආරම්භයේ දී ම මාරයාගේ ග්‍රහණයට හසු වූහ. අනතුරට පත් පළමු මුව රංචුව උපමා කොට ගනිමින් පෙන්වා දුන් පළමු ශ්‍රාවක පිරිස මොවුන් ය.

දෙවන පිරිස පංචකාමයෙන් ඉවත් ව සුදුසු පරිසරයන්හි වාසය කරමින් කිසියම් කාලයක් ධර්මයෙහි හැසිරෙති. එහෙත් දිගින් දිගට ම ධර්ම මාර්ගයෙහි නියැළීමට ඔවුහු අසමත් ව පසුකාලීනව නැවතත් පංචකාමයට පැමිණෙති. මෙලෙස දෙවන ශ්‍රාවක පිරිස ද මාරයාගේ ග්‍රහණයෙන් නොමිදුණාහ. එහි ප්‍රතිඵල වශයෙන් ඔවුහු ධර්මයෙන් ඉවත් ව සාමාන්‍ය ජනතාව මෙන් කාමභෝගී ජීවිතයක් ගත කරති.

තෙවන ශ්‍රාවක පිරිස පංචකාමයෙන් බෙහෙවින් ඉවත් ව බණ භාවනා කරමින් වාසය කරති. එහෙත් ඔවුහු විවිධ දෘෂ්ටිවලට හසු වෙති. ඒ අනුව ලෝකය සදාකාලික කියා ද, ලෝකය සදාකාලික නොවේ කියා ද, ලෝකය කෙලවරක් ඇත්තේ කියා ද, ලෝකය කෙලවරක් නැත්තේ කියා ද, එය ජීවය කියා ද, එය ශරීරය කියා ද, ජීවය අනෙකකි - ශරීරය අනෙකකි කියා ද, ජීවයත් ශරීරයත් එකක් ය කියා ද, සත්වයා මරණින් මතු වන්නේ ය කියා ද, සත්වයා මරණින් මතු නොවන්නේ ය කියා ද, සත්වයා මරණින් මතු වන්නේත් වේ ය - නොවන්නේත් වේ ය කියා ද, සත්වයා මරණින් මතු වන්නේත් නොවේ ය - නොවන්නේත් නොවේ ය කියා ද ආදී වශයෙන් විවිධ දෘෂ්ටීන්ට පැමිණ මානසික වශයෙන් එහි සිර වී කල් ගෙවති. මෙලෙස දෘෂ්ටිවලට සිර වී කල් ගත කිරීම හේතුවෙන් බලාපොරොත්තු වූ පරිදි සැබෑ විමුක්තියකට පත්වීමට ඔවුහු අසමත් වෙති. ඔවුහු ද මාරයාගේ ග්‍රහණයට හසු වූහ.

ඉහත සඳහන් තුන් පිරිසට ම අත් වූ ස්වභාවය දුටු සිව්වන ශ්‍රාවක පිරිස එම කිසිදු තැනක මුළාවට පත් නොවී දෘෂ්ටිවලින් ද මිදී අප්‍රමාදීව සිත සමාධිමත් කරලීමෙහි නිරත වෙති. ***'ජානතෝ අහං භික්ඛවේ පස්සතෝ ආසවානං ඛයං වදාමි ...'*** යනුවෙන් දක්වෙන පරිදි ආශ්‍රවක්ෂය කර ගැනීමෙහි යෙදෙන ශ්‍රාවකයා ධර්ම මාර්ගය ආරම්භයේ දී ම හේතුඵල දහම පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීම අවශ්‍ය කෙරේ. ඒ අනුව ආරම්භයේදී ම පංචුපාදනස්කන්ධයේ හටගැනීම හා නිරුද්ධවීම පිළිබඳ මනා

දැක්මකින් යුතු සම්මාදිට්ඨිය උපදවා ගෙන ආනාපානසති ආදි භාවනාවක යළි යළිත් යෙදෙමින් සිත සමාධිමත් කර ගත යුතු ය. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ පංචකයේ හටගැනීම (සමුදය) දකින නුවණැති ශ්‍රාවකයා **'නැත'** යන අන්තයෙන් මිදෙයි. රූපාදි ස්කන්ධ පංචකයේ නිරුද්ධවීම (නිරෝධය) දකින නුවණැති ශ්‍රාවකයා **'ඇත'** යන අන්තයෙන් මිදෙයි. මෙලෙස **'ඇත'** හා **'නැත'** යන අන්ත දෙක ම එක ම දර්ශනයෙන් දුරුවීම අවශ්‍ය වේ. ***'දිට්ඨිං ච අනුපගම්ම සීලවා දස්සනේන සම්පන්නෝ'*** යනුවෙන් මෙත්ත සූත්‍රයෙහි දැක්වෙන පරිදි සැබෑ විමුක්තියක් ලැබෙන්නේ ඉහත දෘෂ්ටිවලින් මිදී සීල, සමාධි, පඤ්ඤා වැඩීමේ ප්‍රතිඵල වශයෙනි.

මෙලෙස මනා දර්ශනයකින් යුතුව සිත සමාධිමත් කිරීමේ ප්‍රතිඵල වශයෙන් විතක්ක, විචාර, පීති, සුඛ, ඒකග්ගතා සහිත ප්‍රථමධ්‍යානයට පත් ව කල් ගෙවති. මෙලෙස ප්‍රථමධ්‍යානය උපදවා සමාධිමත් සිතින් වාසය කිරීම මරුවාගේ සීමාව ඉක්මවා යාමකි. පංච නීවරණ ප්‍රහීණ කොට පංචකාමයට ඇති ඇල්ම දුරු කළ ශ්‍රාවකයා මරුවාගේ ඇස් අන්ධ කළ තැනැත්තකු වශයෙන් බුදුදහමෙහි දක්වා තිබේ.

ප්‍රථමධ්‍යානයට පත් ශ්‍රාවකයා එහි ඇති මානසික සුවය අත්විඳීම නිසා තව දුරටත් සිත සමාධිමත් කිරීමෙහි යෙදෙයි. එහි ප්‍රතිඵල වශයෙන් විතක්ක, විචාර ඉක්මවා සමාධියෙන් හටගෙත් පීති, සුඛ, ඒකග්ගතා සහිත දෙවන ධ්‍යානයට පත් ව කල් ගෙවති. මෙය ද තවදුරටත් මරුවාගේ සීමාවෙන් ඈතට යාමකි.

තව තවත් සිත සමාධිමත් කිරීමෙහි යෙදෙන ශ්‍රාවකයා ප්‍රීතිය ද දුරුකොට කායික සුවයෙන් යුතු සුඛ ඒකග්ගතා සහිත තෙවන ධ්‍යානයට පත් ව වාසය කරයි. මෙලෙස තෙවන ධ්‍යානයට පත්වීම මරුවාගේ සීමාව ඉක්මවා තව තවත් ඈතට යාමකි.

ඒ අතර යළි යළිත් සිත සමාධිමත් කරන ශ්‍රාවකයා සුඛ ද දුරු කොට උපේක්ෂා ඒකග්ගතා සහිතව සතරවන ධ්‍යානයට පත්ව වඩ වඩාත් සමාධිය තුළ සිත තැන්පත් ව මානසික සුවයෙන් කල් ගෙවති. මෙලෙස රූපාවචර ධ්‍යාන සතර ලබා ගත් ශ්‍රාවකයා රූපාවචර ධ්‍යාන ඉක්මවා අරූපාවචර මට්ටමට තම සිත දියුණු කරයි. ඒ අනුව **'අනන්තෝ ආකාසෝ, අනන්තෝ ආකාසෝ ...'** (ආකාසය අනන්ත ය) යනුවෙන් මෙනෙහි කිරීමේ ප්‍රතිඵල වශයෙන් ආකාසානඤ්චායතන නමැති අරූපාවචර ධ්‍යානයට පත් ව වෙසෙයි. ඉන් නොනවතින ශ්‍රාවකයා තවදුරටත් සිත තැන්පත් කරමින් **'අනන්තං විඤ්ඤාණං අනන්තං විඤ්ඤාණං...'** (විඤ්ඤාණය අනන්ත ය) යනුවෙන් මෙනෙහි කිරීමේ ප්‍රතිඵල වශයෙන් විඤ්ඤාණඤ්චායතන නමැති දෙවන අරූප ධ්‍යානයට පත් ව වෙසෙයි. තව තවත් සමාධිය තුළ හික්මෙන ශ්‍රාවකයා **'නත්‍ථි කිඤ්චි'ති, නත්‍ථි කිඤ්චි'ති...'** (කිසිවක් නැත) යනුවෙන් මෙනෙහි කරමින් සිත සමාධිමත් කොට ආකිඤ්චඤ්ඤායතන නමැති තෙවන අරූප ධ්‍යානයට පත් ව සමාධිමත් ව වෙසෙයි. ඉන් නොනවතින ශ්‍රාවකයා **'ඇත්තේත් නැත, නැත්තේත් නැත'** යනුවෙන් මෙනෙහි කරමින් සිත සමාධියට පමුණුවයි. එහි ප්‍රතිඵල වශයෙන් නේවසඤ්ඤානාසඤ්ඤායතනයට පත් ව වාසය කරයි.

මෙලෙස රූපාවචර හා අරූපාවචර වශයෙන් සිත සමාධිමත් කරන ශ්‍රාවකයා ඉන් නොනැවතී ප්‍රඥාව දියුණු කිරීම් වශයෙන් පඤ්ඤා භාවනාවෙහි ද යෙදෙයි. **'සමාහිතෝ භික්ඛවේ යථාභූතං**

**පජානාති'** යනුවෙන් දැක්වෙන පරිදි පටිච්ච සමුප්පාදය පිළිබඳ අවබෝධයෙහි පිහිටා සමාධිමත් කළ ශ්‍රාවකයා සමාධියෙන් නොනවතින අතර සියලු ධර්මයන්හි පවත්නා අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය නුවණින් මෙනෙහි කරයි. එහි ප්‍රතිඵල වශයෙන් ක්‍රමයෙන් අවිද්‍යාවෙන් සිත මිදෙන අතර ප්‍රඥාව ක්‍රමයෙන් දියුණු වේ. ලෝභ, ද්වේෂ, මෝහ යන අකුසලයන්ගෙන් සිත මිදෙමින් දුකින් නිදහස් වීමට ද අවස්ථාව උදාවේ. බුදුදහමේ දැක්වෙන ඉහළ ම ආධ්‍යාත්මික දියුණුව වශයෙන් සැලකෙන්නේ හුදෙක් සිත සමාධිමත් කරලීම පමණක් නොව සමාධිමත් වූ සිතින් නුවණින් ලෝක යථාර්ථය පසක් කරගැනීමයි. සසරගත දුකින් සපුරා නිදහස්වීමට අවස්ථාව ලැබෙන්නේ මෙලෙස ක්‍රියා කිරීමෙහි ප්‍රතිඵල වශයෙනි. මෙය තුන් ලෝකය ම තරණය කිරීමක් - ජයගැනීමක් වශයෙන් දක්වා තිබේ *(තිණ්ණෝ ලෝකේ විසත්තිකන්ති)*.

මනා දර්ශනයකින් යුතුව සතිපට්ඨානය තුළ පිහිටා සමථ විදර්ශනා දියුණු කරන විට සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන ඉන්ද්‍රිය ධර්ම දියුණු වන අතර සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන බොජ්ඣංග ධර්ම වර්ධනය වී සම්මාදිට්ඨි ආදි මාර්ගාංග සම්පූර්ණ කරමින් ක්‍රමයෙන් විද්‍යා, විමුක්ති සාක්ෂාත් වනු ඇත. මාරයාගේ ග්‍රහණයෙන් සම්පූර්ණයෙන් නිදහස්වීමට අවකාශ ලැබෙන්නේ මෙලෙස සම්මාදිට්ඨියෙන් යුතුව සීල, සමාධි, පඤ්ඤා යන ත්‍රිවිධ ශික්ෂාවෙහි යෙදීමෙහි ප්‍රතිඵල වශයෙනි.

කැලිෆෝනියාවේ පැසදිනාහි ලොස් ඇන්ජලිස් බෞද්ධ විහාරස්ථානයේ

ස්වාමීන් වහන්සේලා මෙහෙයවන

# ධර්ම චාරිකා වැඩසටහන

බු.ව. 2560 නවම් මස (ව්‍ය.ව. 2017.02.25) ශනි දින

(දායකත්වය: ගනනාත් විජේරත්න මහත්මා - මහත්මිය, දරුවන් සහ දෙමාපියන්)